ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No.

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date. 2025.02.07

පැමිණිලිකාර පාර්ශවය : එච්.එච්.එම්. ෆාහිම් මයා,
3/2, විපුලසේන මාවත,
කොළඹ 10.

වගඋත්තරකාර පාර්ශවය : සභාපති,
ශ්‍රී ලංකා වරාය අධිකාරිය,
අංක 19, චෛත්‍ය පාර,
කොළඹ 01.

**පැමිණිලි අංකය : එච්ආර්සී/1657/25**

පැමිණිල්ල

උක්ත පැමිණිලිකරු විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කරමින් සඳහන් කර ඇත්තේ පැමිණිලිකරු ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ස්ථිර සේවකයෙකු ලෙස 1996.10.03 දින සිට පත්වීම් ලබමින් විධායක නිලධාරියෙකු ලෙස ද අධිකාරී (ක්‍රියාකරවන) තනතුරට පත්ව ප්‍රධාන අධිකාරී (ක්‍රියාකරවන), කළමණාකරු (ක්‍රියාකරවන) සහ ජ්‍යෙෂ්ඨ ක්‍රියාකරවන කළමණාකරු ලෙසත් උසස්වීම් ලබමින් ක්‍රියාකරවන කොට්ඨාශයේ මෙහෙයුම් ක්‍රියාවලිය තුළ කාර්යභාර නිලධාරී, නෞකා සැලසුම්, ජ්‍යෙෂ්ඨ නෞකා සැලසුම් නිලධාරී, කාර්යභාර කළමණාකරු ලෙස සක්‍රිය සේවා පළපුරුද්ද වසර 18 ට වැඩි බවත් ය.

නියෝජ්‍ය ප්‍රධාන ක්‍රියාකරවන කළමණාකරු තනතුරේ පැවති සේවා අවශ්‍යතාව මත 2024.08.01 දින සිට රාජකාරි ආවරණය කිරීමට පැමිණිලිකරු වෙත පවරා තිබුණු අතර එකී තනතුරේ රාජකාරි ආවරණය කරමින් කොට්ඨාශයේ ජයබහළු පර්යන්තයේ මෙන්ම නැගෙනහිර බහළු පර්යන්තයේ ද මෙහෙයුම් හා පරිපාලන කටයුතු හා සම්බන්ධව සක්‍රිය දායකත්වයක් දැක්වූ අතර එම කොට්ඨාශයේ 1500 කට ආසන්න සේවකයින්ගෙන් මෙහෙයුම් ක්‍රියාවලිය තුළ නිසි අධීක්ෂණය හා පාලනය පවත්වාගෙන යාමටත් අඛණ්ඩ දායකත්වයක් ලබා දුන් බවත් වැඩිදුරටත් දන්වා ඇත.

ඉහත සඳහන් පරිදි පැමිණිලිකරු විසින් රාජකාරි ආවරණය කරමින් සිටි නියෝජ්‍ය ප්‍රධාන ක්‍රියාකරවන කළමණාකරු තනතුරේ පුරප්පාඩු පිරවීම සඳහා ප්‍රධාන මානව සම්පත් කළමණාකරුගේ අංක HRD/EX/06/02/(1) හා 2024.06.24 දිනැතිව පළ කරන ලද දැන්වීම අනුව අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට මෙහෙයුම් ක්‍රියාවලියට සෘජු සම්බන්ධතා ඇති අධිකාරියේ ප්‍රධාන කොට්ඨාශ ත්‍රිත්වය වන

ක්‍රියාකරවන බහාලුම් මෙහෙයුම් ක්‍රියාකරවන සම්ප්‍රදායික හා සේවා සැපයුම් යන කොට්ඨාශ වලින් මෙම තනතුර සඳහා අයදුම්පත් ඉදිරිපත් කිරීමට සුදුසුකම් ලැබුවේ පැමිණිලිකරු ඇතුළු අපේක්ෂකයින් සිව්දෙනෙකු පමණක් බවත් එකී දැන්වීම අනුව අයදුම්පත් ඉදිරිපත් කිරීමට තිබූ අවසන් දිනය 2024.07.15 ලෙසට සඳහන් කර තිබූ බවත් දන්වා ඇත.

එම තනතුර සඳහා අයදුම්කරුවන් විසින් සපුරා තිබිය යුතු සුදුසුකම් ලෙස.

*II (a)* **Educational & Professional Qualification:**

*Should possess a post Graduate Degree/ Post Graduate Diploma from a recognized University in Business Administration/Marketing/Management/Port Management/Commerce/Economics/Logistics & Transport or Statistics.*

*With*

**Experience:**

*One (01) year active experience in SLM 3*

***Or***

*(b)* **Educational & Professional Qualification:**

*Should possess a Degree from a recognized University in Business Administration/Marketing/Management/Management/Commerce/Economics/Logistics & Transport/Geography/Statistics/Mathematics/ Degree with relevant subjects.*

*Or*

*Should possess a Degree from a recognized University and the relevant Diploma/Membership from a recognized Professional Institution (period of the Diploma should be not less than one (01) year)*

*With*

**Experience:**

*Two (02) year active experience in SLM 3*

යන සුදුසුකම් දක්වා සිටි බවත් වැඩිදුරටත් දක්වා ඇත.

එසේ වුවද ප්‍රධාන කළමණාකරු (මානව සම්පත් හා පරිපාලන) විසින් ඉහත පුරප්පාඩු පිරවීම සඳහා දැන්වීමේ සඳහන් අවසන් දිනට දින 10 කට පසු එනම් 2024.07.25 දිනැති දැන්වීම මගින් අයදුම්පත් ඉදිරිපත් කිරීමේ කාලය 2024.08.15 දින දක්වා දීර්ඝ කළ බවත්, එසේ දීර්ඝ කිරීම හේතුවෙන් තවත් අයදුම්කරුවන් තිදෙනෙකු එකී තනතුර සඳහා අයදුම්පත් ඉදිරිපත් කළ බවත් ඊට අදාළව 2025.02.24 දින පවත්වන ලද සම්මුඛ පරීක්ෂණයේදී තේරී පත්වී ඇත්තේ එම තිදෙනා බවත් වැඩිදුරටත් දක්වා ඇත.

i තවද එම අයදුම්කරුවන් තිදෙනාම මෙම කාලය දීර්ඝ කිරීමෙන් පසුව සුදුසුකම් ලැබූ අපේක්ෂකයින් බවත්,

ii ඉහත කී තනතුර සඳහා පවත්වන ලද සම්මුඛ පරීක්ෂණයෙන් එම තිදෙනා 1, 2, 3 ස්ථාන ලබා ගෙන ඇති බවත්,

iii එසේ කාලය දීර්ඝ කිරීමට කටයුතු කළේ 1, 2, 3 ස්ථාන ලබා ගත් අපේක්ෂකයින් තිදෙනා සිටි තනතුරේ වසරක කාලය සම්පූර්ණ වන දින දක්වා ඔවුන්ට සාධනීය වන පරිදි අයදුම්පත් බාරගැනීමේ අවසාන දිනය තීරණය කර ඔවුන් තිදෙනාට අයදුම් කිරීමට පසුබිම සලසා දීමෙන් 2024 වර්ෂයේදී අයදුම් කිරීමේ කාලය දීර්ඝ කරමින් ඉහත තනතුරට හිමිකමක් පැවති පැමිණිලිකරුගේ අවස්ථාව අහිමි කිරීමකට ලක් කර ඇති බවට පැමිණිලිකරු විසින් සදහන් කර ඇත.

කෙසේ නමුත් 2023.05.02 දින ඉහත කී නියෝජ්‍ය ප්‍රධාන ක්‍රියාකරවන කළමණාකරු තනතුරට අදාළ පුරප්පාඩු පිරවීම සඳහා අයදුම්පත් කැඳවා තිබූ අවස්ථාවේදී එහිදී අයදුම්පත් ඉදිරිපත් කිරීම සඳහා වූ අවසන් දිනය ලෙස දන්වා තිබුණේ 2023.05.25 දින වූ අතර එම අවස්ථාවේදී එකී තනතුර සඳහා මෙම පැමිණිලිකරු අයදුම් කිරීමට නම් එහි ඉල්ලා තිබූ සේවා පළපුරුද්ද මෙම පැමිණිලිකරුට සම්පූර්ණ වීමට නියමිතව තිබුණේ 2023.06.03 දිනට වන බැවින් ඒ සම්බන්ධයෙන් සළකා බලා අවසන් දිනය දීර්ඝ කරන ලෙසට පැමිණිලිකරු විසින් ඉල්ලීමක් කළ නමුත් එහිදී දින 08 ක කාලය කෙරෙහි එම අවස්ථාවේ සළකා බැලීමක් සිදු නොකරන ලද අතර ඔහුගේ ඉල්ලීම ද ප්‍රතික්ෂේප වූ බවට වැඩිදුරටත් දන්වා ඇත.

තවද, 2021.03.09 ජ්‍යෝෂ්ඨ ක්‍රියාකරවන තනතුරට අදාළව පැවති සම්මුඛ පරීක්ෂණයේ දී පැමිණිලිකරු හට හිමිවිය යුතු උසස්වීම හිතාමතා වලක්වාලමින් එම අවස්ථාවේ සුදුසුකම් නොලැබූ අයට ලකුණු ලබා දී ඔවුන්ට හිතෛෂී අපේක්ෂකයෙකුට ප්‍රමුඛතාව ලබා දුන් අතර එම සම්මුඛ පරීක්ෂණයේදී ද සමානයන් අතර අසමාන ලෙස ලකුණු ලබාදීම පිළිබඳව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත කරන ලද පැමිණිල්ලේ ප්‍රතිඵලය මත මෙම වගඋත්තරකරු විසින් එම තනතුර ලබාදී එකී වැරුද්ද නිවැරදි කරනු ලැබූ බවත් 2023 වර්ෂයේ නියෝජ්‍ය ප්‍රධාන ක්‍රියාකරවන කළමණාකරු තනතුරටද ස්ථිර වූ බවත් සඳහන් කර ඇත.

ඒ අනුව 2024 වර්ෂයේදී ද පැමිණිලිකරුට ලැබීමට නියමිත වූ අවස්ථාව අත්තනෝමතික ලෙස කටයුතු කර අහිමි කිරීමත් හිතාමතා පැමිණිලිකරුගේ උසස්වීමේ අවස්ථාව හා ජ්‍යෝෂ්ඨත්වය නැවත නැවතත් අහිමි කිරීමක් බවත් පැමිණිලිකරු විසින් සඳහන් කර ඇත.

ක්‍රියාකරවන බහලු මෙහෙයුම් කොට්ඨාශයේ නියෝජ්‍ය ප්‍රධාන ක්‍රියාකරවන තනතුරේ රාජකාරි ආවරණය කරමින් පළමු දැන්වීමෙන් සුදුසුකම් ලැබූ පැමිණිලිකරු හා සැසදීමේදී අයදුම්කරුවන් අතර බේද භාවයක් ඇතිවන ආකාරයෙන් පැමිණිලිකරුගේ උසස්වීම් අවස්ථාව අහිමිවීම සමානාත්මතාවයේ අයිතිය සිතාමතා උල්ලංඝණය කිරීමක් මෙන්ම මානව හිමිකම් උල්ලංඝණයක් සිදුවීමක් බවත් තවදුරටත් දන්වා ඇත.

පැමිණිලිකරු විසින් ඉහත ප්‍රශ්නගත තනතුර සඳහා අයදුම්පත් කැදවීමේ අවසාන දිනය දීර්ඝ කිරීම නීත්‍යානුකූල නොවන කටයුත්තක් බව සඳහන් කරමින් ඒ සඳහා කරුණු ඉදිරිපත් කරමින් දන්වා ඇත්තේ, විධායක නිලධාරීන් සම්බන්ධයෙන් පත්වීම. උසස්වීම, ස්ථාන මාරු කිරීම් වැනි තීරණයක් සභාපතිගේ අනුමැතියට යටත්ව සිදුවන නමුත් ඉහත තනතුරට අදාළව දින දීර්ඝ කිරීම සඳහා සභාපතිගේ අනුමැතිය ලබාගෙන නොමැති බවට සඳහන් කර ඇත.

තවද, දින දීර්ඝ කිරීමෙන් පසුව අයදුම්පත් ඉදිරිපත් කරන ලද අපේක්ෂකයින් සිව්දෙනා මුල් අවස්ථාවේදී අයදුම්පත් ඉදිරිපත් කිරීමට නියමිතව තිබූ 2024.07.15 දින වනවිට SLM 3 ශ්‍රේණියේ අවුරුද්දක කාලය සම්පූර්ණ කර නොතිබූ බවත් එයින් ජේ.ආර්.එම්. සූරිය බණ්ඩාර සහ ඩබ්.එච්.ඒ. පුෂ්පකුමාර යන දෙදෙනාගේ පරිවාස කාලය සම්පූර්ණ වී ඇත්තේ 2024.07.30 දින බවත්, එම දෙදෙනාගේ පත්වීම් ස්ථිර කිරීමේ ලිපි නිකුත් කර තිබෙන්නේ 2024.08.14 දින බවත් සඳහන් කර ඇත.

තවද, අනෙකුත් අයදුම්කරුවන් දෙදෙනා වන පී.ඩී.එස්. පීරිස් සහ පී.එල්.එස්. ලියනගේ යන දෙදෙනාගේ පරිවාස කාලය අවසන් වී ඇත්තේ 2024.08.11 දින බවත් ඔවුන් දෙදෙනා වෙත සේවය ස්ථිර කිරීමේ ලිපි නිකුත් කර තිබෙන්නේ 2024.10.02 දින බවත් වැඩිදුරටත් දන්වා ඇත.

ඒ අනුව ඉහත කී නිලධාරීන්ගේ තනතුරේ වසර 1 ක කාලය සම්පූර්ණ වන දිනය ඔවුන්ට සාධනීය වන

පරිදි මෙම කාලය දීර්ඝ කර අයදුම් කිරීමට පසුබිම සළසා දී සම්මුඛ පරීක්ෂණයේද 1, 2, 3 ස්ථාන වලට තෝරා පත් කිරීම සිතා මතා පැමිණිලිකරුගේ තනතුරු උසස්වීම අවහිර කර ඇති බවට වැඩිදුරටත් දන්වා ඇත.

මෙම ගැටළුව පිළිබඳව පැමිණිලිකරු විසින් ජනාධිපති ලේකම් කාර්යාලයට ද පැමිණිල්ලක් කළ බවත්,

ඊට අදාළව ජනාධිපති ලේකම්ගේ PS/PRD/PR/28/07/09/09/83203 හා 2025.09.09 දිනැති ලිපිය මගින් වගඋත්තරකාර ආයතනය වෙත දන්වා තිබෙන්නේ ඉහත කී උසස්වීම ලබාදීමේදී නිසි ක්‍රමවේදය අනුගමනය කර නොමැති බවට නිරීක්ෂණය වන බැවින් ඒ සම්බන්ධයෙන් පූර්ණ පරීක්ෂණයක් සිදුකර වාර්තා කරන ලෙස බවත් පැමිණිලිකරු විසින් වැඩිදුරටත් දන්වා ඇත.

තවද, විධායක නිලධාරීන්ගේ සංගමය යනු සියළුම විධායක නිලධාරීන් නියෝජනය කරනු නොලබන අතර වෘත්තීය සමිතියක් වශයෙන් සිය සාමාජිකයින් සම්බන්ධයෙන් පමණක් එකී ඉල්ලීම සිදු කර තිබෙන බවත් එවැනි ඉල්ලීම් අනෙකුත් අයදුම්කරුවන් සම්බන්ධයෙන් අගතියක් වන්නේ නම් හා එම අවස්ථාවේ පැවති පුරප්පාඩු සංඛ්‍යාව හා අයදුම්පත් සංඛ්‍යාව සළකා බලා එවැනි ඉල්ලීම් ප්‍රතිපත්තිමය වශයෙන් සළකා බැලීමක් සිදු නොකළ යුතු බවත් තවදුරටත් කරුණු ඉදිරිපත් කර ඇත.

මෙම පැමිණිල්ලට අදාළ වගඋත්තරකාර පාර්ශවය විසින් මෙම කොමිෂන් සභාව වෙත දන්වා ඇත්තේ, මෙම පැමිණිලිකරු 1996.10.03 දින සිට අධිකාරියේ මුල් පත්වීම ලබා 2006.08.01 දින විධායක IV ශ්‍රේණිය අධිකාරී (ක්‍රියාකරවන) තනතුරට ද 2013.12.19 දින ප්‍රධාන අධිකාරී (ක්‍රියාකරවන) SLM 2 තනතුරට ද, 2017.09.26 දින සිට ක්‍රියාකරවන කළමණාකරු SLM 1 තනතුරට ද, 2022.06.03 දින ජ්‍යෙෂ්ඨ ක්‍රියාකරවන කළමණාකරු SLM 3 තනතුරට ද පත්වීම ලබා ඇති බවයි.

නියෝජ්‍ය ප්‍රධාන ක්‍රියාකරවන කළමණාකරු තනතුර සඳහා 2023.05.02 දින අයදුම්පත් කැඳවන ලද බවත් එහි අයදුම්පත් භාර ගැනම 2023.05.25 දිනෙන් අවසන් වූ බවත් එම දින වන විට මෙම පැමිණිලිකරු ජ්‍යෙෂ්ඨ ක්‍රියාකරවන කළමණාකරු SLM 3 තනතුරේ පරිවාස කාලයට යටත්ව සිට ඇති අතර එම තනතුරෙහි ස්ථිර වී නොමැතිව සිටි බවත් සඳහන් කර ඇත. නැවතත් එකී තනතුර සඳහා 2024.06.26 දින අයදුම්පත් කැඳවා ඇති අතර එහි අවසන් දිනය ලෙස 2024.07.15 දින ලෙස දක්වා තිබුණ ද 2024.07.25 දින නිකුත් කරන ලද දැන්වීමක් අනුව අයදුම් කිරීමේ කාලය 2024.08.15 දින දක්වා දීර්ඝ කර ඇති බව දන්වා ඇත.

එම අවස්ථාවේදී 7 දෙනෙකු විසින් අයදුම්පත් ඉදිරිපත් කර තිබූ බවත් 06 දෙනෙකු සම්මුඛ පරීක්ෂණය සඳහා පෙනී සිට ඇති බවත් මෙම පැමිණිලිකරු සිව්වන ස්ථානයට ලකුණු ලබා ඇති බවත්, එම සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබා ගත් අනුපිළිවෙල අනුව 1 හා 2 වන ස්ථානයට පත් අයදුම්කරුවන් දෙදෙනා හට නියෝජ්‍ය ප්‍රධාන ක්‍රියාකරවන කළමණාකරු තනතුර සඳහා සභාපති අනුමැතිය ප්‍රකාරව පත්වීම් ලබා දී ඇති බවත් ඉතිරි අයදුම්කරුවන් සිව් දෙනා පොරොත්තු ලේඛනයේ තබා ඇති බවත් එකී පොරොත්තු ලේඛනය 2026.05.13 දින දක්වා වලංගුව පවතින බවත් කරුණු ඉදිරිපත් කර ඇත.

තවද, සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබා දී ඇත්තේ, ලකුණු ලබාදීමේ ලේඛනයේ මූලික සුදුසුකම් ලැබීම වෙනුවෙන් ලකුණු 25 ක් වෙන් කර තිබෙන්නේ මෙම සුදුසුකම් ලැබීම සඳහා සළකා බලනු ලබන සහතිකවලට නැවත ලකුණු ලබාදීමක් සිදු නොකරන බවයි. එක් එක් අපේක්ෂකයා සතු මූලික සුදුසුකම් ලැබීමට සළකා බලනු ලැබූ සහතිකවලට අමතරව පශ්චාත් උපාධි, පශ්චාත් උපාධි ඩිප්ලෝමා, සාමාජිකත්වය, උපාධි සහ ඩිප්ලෝමා සඳහා දැන්වීමේ ඉල්ලා ඇති පරිදි අදාළ ක්ෂේත්‍රයේ නම් සම්පූර්ණ ලකුණු ප්‍රමාණයද අදාළ ක්ෂේත්‍රයේ නොවන අවස්ථාවලදී සම්පූර්ණ ලකුණු වලින් ලකුණු භාගයක් (1/2) බැගින් ලබා දී ඇති බවත් වැඩිදුරටත් දන්වා ඇත.

තවද, සියළු අපේක්ෂකයින් වරාය අධිකාරියේ සේවය කරන ලද කාලසීමාව සැලකිල්ලට ගෙන වසර තුනක් සඳහා එක් ලකුණක් බැගින් සේවා කාලය සඳහා උපරිම ලකුණු දහය (10) ක් දක්වා ලකුණු ලබා දෙනු ලබන බවත්, අදාළ ක්ෂේත්‍රයේ ලබා ඇති පළපුරුද්ද වෙනුවෙන් එක් වසරක් සඳහා එක් ලකුණක්

බැගින් ලබා දෙන අතර උපරිම ලකුණු ප්‍රමාණය පහළොවක් බවත්, සම්මුඛ පරීක්ෂණයක් පවත්වන දිනට පෙර කාර්තු (02) ක කාර්ය සාධනය සළකා බලා ඒ අනුව උපරිමය ලකුණු විස්සක් දක්වා ලබා දෙන අතර මහපොළ වරාය හා සමුද්‍රීය විද්‍යායතනයෙන් ලබා ගන්නා ඕනෑම සහතික තුනක් හෝ ප්‍රශංසා ලිපියක් සඳහා පොදුවේ ලකුණු පහක් ලබා දෙනු ලබන බවත්, තවද සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ නියෝජිතයින් විසින් අසනු ලබන ප්‍රශ්න සඳහා ලබා දෙන පිළිතුරු සම්මුඛ පරීක්ෂණයට අයදුම්කරුවන් මුහුණ දෙන ආකාරය, ඔහු/ඇය ගේ ආකල්ප සහ නායකත්ව ලක්ෂණ පිළිබිඹු කිරීම යනාදිය සැලකිල්ලට ගෙන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් ඒ ඒ අයදුම්කරුවන්ගේ කුසලතා මත උපරිමය ලකුණු 10 ක් දක්වා ලකුණු ලබා දීමද සිදු කරනු ලබන බවත් යනුවෙන් දන්වා ඇත.

මෙම පැමිණිල්ල සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් වගඋත්තරකාර පාර්ශවයෙන් ලිඛිත වාර්තා ලබා ගෙන ඇති අතර කොමිෂන් සභාවේ අවසාන නිර්දේශය නිකුත් කරන තෙක් එකී ගැටළුසහගත තනතුරට අදාළව පවතින පුරප්පාඩු පිරවීම අත්හිටුවන ලෙසට 2023.10.13 දින අතුරු නිර්දේශයක් ද නිකුත් කර ඇත.

**නිරීක්ෂණය**

උක්ත පැමිණිලිකරු වගඋත්තරකාර ආයතනය වන ශ්‍රී ලංකා වරාය අධිකාරියේ 1996 වර්ෂයේ සිට විවිධ තනතුරු වල සේවය කර ඇති බවත්, පැමිණිල්ලේ සඳහන් ගැටළුවට අදාළ තනතුර වූ නියෝජ්‍ය ප්‍රධාන ක්‍රියාකරවන කළමණාකරු තනතුරේ 2024.08.01 දින සිට රාජකාරි ආවරණය කිරීම සඳහා මෙම පැමිණිලිකරු පත්කර තිබූ බවත් කරුණු අනාවරණය වේ.

වගඋත්තරකාර පාර්ශවය විසින් ඉහත කී නියෝජ්‍ය ප්‍රධාන ක්‍රියාකරවන කළමණාකරු තනතුරේ පැවති පුරප්පාඩු පිරවීම සඳහා 2024.06.26 දිනැති දැන්වීම මගින් අයදුම්පත් කැඳවා ඇති බවත් එකී දැන්වීම නිකුත් කර ඇත්තේ මානව සම්පත් අංශයේ ප්‍රධාන කළමණාකරු (මානව සම්පත් හා පරිපාලන) විසින් බවට 2024.06.26 දිනැති දැන්වීම අනුව නිරීක්ෂණය වන අතර එම දැන්වීම නිකුත් කර ඇත්තේ සභාපතිතුමාගේ අවසරයක් මත බවට, වගඋත්තරකාර පාර්ශවය විසින් පරීක්ෂණයේදී මෙම කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති කරුණු අනුව පැහැදිලි වේ. තවද, ඉහත කී 2024.06.26 දිනැති දැන්වීම අනුව උක්ත තනතුර සඳහා අයදුම්පත් බාරගැනීමේ අවසන් දිනය 2024.07.15 දින ලෙස සඳහන් කර ඇති අතර එකී අවසන් දිනය වනවිට 1එම්.එච්.එම්. ෆාහිම් (පැමිණිලිකරු), 2 කේ.සී. සමරජීව 3 ඩබ්. සෙනෙවිරත්න සහ 4 ආර්. තුෂ්යන්තන් යන අපේක්ෂකයින් අයදුම් කර ඇති බවත් නිරීක්ෂණය වේ. ඉහත තනතුර සඳහා අයදුම්පත් භාරගැනීමේ අවසන් දිනය වූ 2024.07.15 දින සිට දින 10 කට පසුව එනම් 2024.07.25 දිනැති ප්‍රධාන කළමණාකරු (මානව සම්පත් හා පරිපාලන) අත්සනින් අභ්‍යන්තර දැන්වීමක් නිකුත් කර ඇති අතර එකී දැන්වීම මගින් ඉහත සඳහන් 2024.07.15 යන දින 2024.08.15 දින දක්වා දීර්ඝ කර ඇති බවට නිරීක්ෂණය වේ.

මෙවැනි ආකාරයට ඉහත කී තනතුර සඳහා අයදුම් කිරීමේ කාලය දීර්ඝ කිරීම සම්බන්ධව සළකා බැලීමේදී, ඉහත සඳහන් පරිදි දින දීර්ඝ කිරීමට අදාළ අභ්‍යන්තර දැන්වීමේ අත්සන් කර ඇත්තේ ප්‍රධාන කළමණාකරු (මානව සම්පත් හා පරිපාලන) වේ. එසේ නම් එම ප්‍රධාන කළමණාකරු (මානව සම්පත් හා පරිපාලන) ලෙස එවැනි දින දීර්ඝ කර දැන්වීමක් නිකුත් කරන ලෙසට බලයක් පැවරී තිබිය යුතුය. ඊට හේතුව වන්නේ ප්‍රධාන කළමණාකරු (මානව සම්පත් හා පරිපාලන) යන තනතුර ඉහත වගඋත්තරකාර ආයතනයේ ඉහළම තනතුර නොවන අතර, බඳවා ගැනීමේදී හෝ උසස් කිරීමේදී ස්වයං තීන්දු තීරණ ගැනීමට බලය තිබෙන තනතුරක් බවට වගඋත්තරකාර පාර්ශවය විසින් සනාථ කර නොමැත. ප්‍රධාන කළමණාකරු (මානව සම්පත් හා පරිපාලන) යන තනතුරට ඉහළින් අධ්‍යක්ෂ (මානව සම්පත්), අතිරේක කළමණාකාර අධ්‍යක්ෂ, කළමණාකාර අධ්‍යක්ෂ, උප සභාපති, සභාපති යනුවෙන් ධූරාවලියක් පිහිටුවා ඇත. එවැනි ධූරාවලියක් පවතින ආයතනයක ධූරාවලියේ ඉහළම බලය දරණ නිලධාරියාගේ අනුමැතියක් සහිතව තීන්දු/තීරණ ගැනීම විධිමත් කාර්යයක් වේ.

කරුණු එසේ තිබියදී, ඉහත සඳහන් ධූරාවලියේ ඉහළම බලය දරා නොමැති එක් නිලධාරියෙකු විසින් තනි

අභිමතයට තීන්දු තීරණ ගෙන තිබේනම් එය පිළිගත නොහැකි ව පවතී. ඊට හේතුව වන්නේ, අත්තනෝමතික ලෙස බලය අවභාවිතා කිරීමක් මොනයම් හෝ හේතුවක් නිසාවෙන්වත් අනුමත කළ නොහැකි කාරණාවක් වන නිසාය.

මෙම පැමිණිල්ලේ උද්ගත වී ඇති ප්‍රධානම ගැටළුව වන්නේ ප්‍රධාන කළමණාකරු (මානව සම්පත් හා පරිපාලන) විසින් 2024.07.15 ලෙස සඳහන්ව තිබූ කාලය ඔහු විසින් 2024.07.25 දිනැති ලිපිය මගින් 2024.08.15 දින දක්වා දීර්ඝ කර ඇත්තේ ඔහුගේ අභිමතය අනුව ද යන්න වේ. මෙම පැමිණිලි විභාග කිරීමේදී වගඋත්තරකාර පාර්ශවයෙන් උක්ත තනතුර සඳහා දින දීර්ඝ කිරීම සම්බන්ධව විමසීමේදී දන්වා ඇත්තේ ඉහත කී අයදුම්පත් බාරගැනීමේ දින අවසන් වීමට ප්‍රථමව විධායක නිලධාරීන්ගේ සංගමයේ ලේකම් විසින් යොමු කර ඇති ඉල්ලීම් ලිපිය සළකා බලා ඒ අනුව අතිරේක මානව සම්පත් කළමණාකරු විසින් ප්‍රධාන කළමනාකරු (මානව සම්පත් හා පරිපාලන) වෙත එම ලිපියේ යොදා ඇති සටහන අනුව එවැනි දින දීර්ඝ කිරීමක් ප්‍රධාන කළමණාකරු (මානව සම්පත් හා පරිපාලන) විසින් සිදු කර ඇති බවයි.

ඉහත කී සංගමය විසින් ඉදිරිපත් කරන ලද ඉල්ලීම් ලිපියේ පිටපතක් මෙම කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති අතර, එකී ලිපියේ අන්තර්ගතය සළකා බැලීමේදී එම ලිපිය අතිරේක කළමණාකාර අධ්‍යක්ෂ වෙත සිදු කර ඇති ඉල්ලීමක් බවත්, එහිදී ඉල්ලා ඇත්තේ නියෝජ්‍ය ප්‍රධාන ක්‍රියාකරවන කළමණාකරු තනතුර සහ නියෝජ්‍ය ප්‍රධාන කළමණාකරු (Marketing and Business Development) තනතුර සඳහා කැඳවා ඇති අයදුම්පත්‍ර අවසන් කාලය දින දීර්ඝ කරන ලෙසත්, ඊට හේතුව ලෙස නිලධාරීන් කිහිප දෙනෙකු පරිවාස කාලය සම්පූර්ණ කිරීම සඳහා සුළු කාලයක් තිබෙන බවත්, එසේ පරිවාස කාලය අවසන් කර ඉහත තනතුරු සඳහා අයදුම් කිරීමට හැකි වන සේ සති 3 ක කාලයක් සඳහා දින දීර්ඝ කිරීමට අදාළව ඉල්ලීමක් සිදු කර ඇති බවටත් නිරීක්ෂණය වේ.

එම ලිපියේ අතිරේක කළමණාකාර අධ්‍යක්ෂ (පරිපාලන) විසින් ප්‍රධාන කළමණාකරු (මානව සම්පත් හා පරිපාලන) වෙත 02.07 .2024 දිනැතිව සටහනක් යොදා සඳහන් කර ඇත්තේ " Please discusses we may given time till 31.07.2024" යනුවෙන් වේ. නමුත් එම ඉල්ලීම පදනම් වී නිලධාරී මණ්ඩලය විසින් හෝ සභාපතිගේ හෝ අනුමැතියක් ලද බවට කිසිදු කරුණක් ඉදිරිපත් වී නොමැත.

වගඋත්තරකාර පාර්ශවය විසින් මෙම කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති කරුණු වන්නේ ඉහත කී පරිදි දින දීර්ඝ කිරීම සඳහා සභාපතිගෙන් අනුමැතියක් ගෙන නොමැති නමුත් ප්‍රධාන කළමණාකරු (මානව සම්පත් හා පරිපාලන) වෙත එවැනි ආකාරයට කටයුතු කිරීමට බලය තිබෙන බවයි. නමුත් බලය පැවරී ඇත්තේ කුමන ආකාරයටද? කවුරුන් විසින්ද යන්න කිසිදු ලේඛනයක් ඉදිරිපත් කර නොමැති අතර එසේ දින දීර්ඝ කිරීමට ඉහත සඳහන් ධූරාවලියේ ඉහළ නිලධාරියෙකුගෙන් ලද අනුමැතියක් හෝ ඉදිරිපත් කිරීමෙන් තොරව ප්‍රධාන කළමණාකරු (මානව සම්පත් හා පරිපාලන) වෙත බලය තිබෙන බවට ඉදිරිපත් කර ඇති කරුණු පිළිගත නොහැක.

ඒ අනුව, පැවරී ඇති බලතලවලට පරිභාහිරව කටයුතු කර 2024.07.15 යන දින 2024.08.15 දක්වා දින දීර්ඝ කිරීම හේතුවෙන් උක්ත තනතුර සඳහා තවත් අපේක්ෂකයින් තිදෙනෙකුට අයදුම් කිරීමට හැකියාව උදාවී ඇති බවත්, සම්මුඛ පරීක්ෂණයේදී 1, 2 සහ 3 යන ස්ථානයන් ලබා ඇත්තේ එම තිදෙනා බවත් නිරීක්ෂණය වේ.

තවද, එම නිලධාරීන් තිදෙනා 2024.07.15 දින වන විට එනම් මුල් අවස්ථාවේදී නිකුත් කරන ලද අභ්‍යන්තර දැන්වීමේ සඳහන් අයදුම් පත් ඉදිරිපත් කිරීමට නියමිත දිනය වන විට උක්ත තනතුර සඳහා වූ සුදුසුකම් සපුරා නොතිබූ අතර දින දීර්ඝ කිරීම හේතුවෙන් සුදුසුකම් ලබා එම තනතුර සඳහා අයදුම්පත් ඉදිරිපත් කර ඇති බවට ද පැමිණිලිකරු විසින් ඉදිරිපත් කර ඇති කරුණු අනුව නිරීක්ෂණය වේ. මේ පිළිබඳව වගඋත්තරකාර පාර්ශවයෙන් උක්ත තනතුර සඳහා අයදුම්පත් ඉදිරිපත් කරන ලද අපේක්ෂකයින් SLM 3 ශ්‍රේණියේ ශ්‍රේණිගත කළ දිනය, එකී ශ්‍රේණියේ පරිවාස කාලය සම්පූර්ණ කළ දිනය සහ එකී ශ්‍රේණියේ ඔවුන් ස්ථිර කළ දිනය සහ අදාළ ලේඛන ඉදිරිපත් කරන ලෙසට දන්වා තිබූ නමුත් වගඋත්තරකාර පාර්ශවය විසින් මේ පිළිබඳව කරුණු දැක්වීමක් හෝ ලේඛන ඉදිරිපත් කිරීමක් සිදු කර

නොමැති බැවින් පැමිණිලිකරු විසින් ඉදිරිපත් කර ඇති කරුණු වගඋත්තරකාර පාර්ශවය විසින් හබ නොකිරීමේ පදනම මත මෙම කොමිෂන් සභාව විසින් එම කරුණු සියල්ල පිළිගන්නා ලදී.

ආයතනයක බඳවා ගැනීමකදී හෝ උසස් කිරීමක් සිදු කරන අවස්ථාවේදී විධිමත් අවසරයකින් තොරව ෙඅයදුම්පත් කැඳවීමට තිබෙන අවසාන දිනය දීර්ඝ කරන විට ඇතැම් අයදුම්කරුවන්ට අසාධාරණ වාසියක් ලබා දීම, සමානාත්මතාවයේ මූලධර්මය උල්ලංඝණයවීමක් විය හැකිය.

ශ්‍රී ලංකා සමාජවාදී ජනරජයේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව පහත පරිදි වේ.

> " නීතිය පසිඳලීම සහ ක්‍රියාත්මක කිරීම ද, නීතියේ රැකවරණය ද සර්ව සාධාරණ විය යුත්තේ ය."

ඉහත සඳහන් ව්‍යවස්ථාව මගින් තහවුරු කර ඇති සියලුම පුද්ගලයින්ට නීතියේ සමාන ආරක්ෂාව හිමිවේ යන අයිතිය අවිධිමත් හා අත්තනෝමතික ලෙස කටයුතු කිරීම එම අයිතිය උල්ලංඝණයවීමක් බවට නිරීක්ෂණය වන අතර රජයේ ආයතන වල පවතින බඳවා ගැනීම් හා උසස්කිරීම් වලදී අත්‍යාවශ්‍ය වන විනිවිදභාවය සහ සාධාරණත්වය පිළිබඳ මූලධර්මයට පටහැනි වන බවද නිරීක්ෂණය වේ.

*A.A. Sarath v Commissioner General of Excise SC FR 661/2012* යන නඩුවේ Sripavan CJ විසින් පහත පරිදි සඳහන් කර ඇත;

> " It is well settled that the absence of arbitrary power is the first essential component by the Rule of Law. The Rule of Law from this point of view means that decisions should be made, based on known principles and ruled and such decisions should be predictable whereby a citizen should know where he stands in relation to such decisions. If the action of the Executive is not based on valid relevant principles applicable alike to all similarly situate and is based on extraneous or irrelevant considerations it would be denial of the doctrine of equality enshrined under Article 12 (1) of the Constitution. It may even amount to 'mala fide' exercise of power."

තවද, අනවසර දින දීර්ඝ කිරීමක් මුල් නීති රීතිවලට අනුකූල වූ අපේක්ෂකයින්ගේ අයිතිවාසිකම උල්ලංඝණය කරන අත්තනෝමතික විධායක හෝ පරිපාලන ක්‍රියාවක් ලෙස සැලකිය හැකිය. තවද, මුල් දැන්වීම අනුව සියළුම සුදුසුකම් සම්පූර්ණ කර තිබූ අයදුම්කරුවන් හට ඔවුන් සියළුම නීති රීති කොන්දේසි වලට අනුගමනය කරනු ඇතැයි යනුවෙන් නීත්‍යානුකූල අපේක්ෂාවක් ඇතිව මෙම පැමිණිල්ලේ ඉදිරිපත් කර ඇති කරුණු අනුව මුල් අවස්ථාවේදී සියලුම සුදුසුකම් සම්පූර්ණ කරන ලද පැමිණිලිකරු ඇතුළුව අයදුම්කරුවන් සිව්දෙනෙකු පමණක් අයදුම් කර තිබූ අතර, එයින් එක් අයදුම්කරුවෙකු සම්මුඛ පරීක්ෂණය පැවැත්වීමට පෙර විශ්‍රාම ගොස් ඇති අතර තවත් අයදුම්කරුවෙකු සම්මුඛ පරීක්ෂණය සඳහා සහභාගී වී නොමැත. එවැනි අවස්ථාවකදී උක්ත තනතුර සඳහා තිබූ පුරප්පාඩු සඳහා විශාල තරගයක් නොමැතිව තේරී පත්වීමට නීත්‍යානුකූල අපේක්ෂාවක් පැමිණිලිකරු හට ඇතිවී තිබීමට ඉඩකඩ තිබුණු බවට ද කරුණු අනාවරණය වේ. ඊට හේතුව වන්නේ උක්ත තනතුර සඳහා 2025.02.24 දින පවත්වා ඇති සම්මුඛ පරීක්ෂණයේදී ලබා දුන් ලකුණු ලැයිස්තුව සළකා බැලීමේදී 1, 2 සහ 3 යන ස්ථානයන් ලබා ඇත්තේ අයදුම්පත් කැඳවීමේ දින දීර්ඝ කිරීමට පසු අයදුම්පත් ඉදිරිපත් කර ඇති අයදුම්කරුවන් තිදෙනා වන අතර, සිව්වන ස්ථානය ලබා ඇත්තේ මෙම පැමිණිල්ලේ පැමිණිලිකරු වේ. ඒ අනුව අවිධිමත් ලෙස දින දීර්ඝ කිරීමක් සිදු නොවුවානම්, මෙම පැමිණිලිකරු උක්ත තනතුර සඳහා තෝරා පත් කර ගැනීමට හැකිව තිබූ නමුත් ආයතනයේ අවිධිමත් අත්තනෝමතික ක්‍රියාවලිය හේතුවෙන් එම අවස්ථාව අහිමි වී ඇති බවට පැහැදිලි වේ.

තවද, වගඋත්තරකාර පාර්ශවය විසින් එනම්, ප්‍රධාන කළමණාකරු (මානව සම්පත් හා පරිපාලන) විසින් ඉහත සඳහන් කළ පරිදි අයදුම්පත් ඉදිරිපත් කිරීමේ අවසන් දිනය 2024.08.15 දින දක්වා දීර්ඝ කිරීමට අදාළ දැන්වීම පළ කර තිබෙන්නේ 2024.07.25 දින වේ. එනම් මුල් අවස්ථාවේ දී පළ කරන ලද දැන්වීම අනුව අයදුම්කිරීමේ අවසන් දිනය 2024.07.15 දිනෙන් පසුව බවට නිරීක්ෂණය වේ. ඒ වනවිට

පැමිණිලිකරු ඇතුළු අයදුම්කරුවන් සිව් දෙනෙකු අයදුම් කර තිබූ බවත් නිරීක්ෂණය වේ. මෙහිදී දින දීර්ඝ කිරීමට අදාළ දැන්වීමක් නිකුත් කර ඇත්තේ දින 10 කට පසුව බැවින් ඉහත කී සිව් දෙනාගේ අයදුම්පත් පරීක්ෂා කර සුදුසුකම් සහිත අයදුම්කරුවන් කවුරුන්ද යන්න තීරණය කිරීමට කාලයක් තිබූ බවත් සිතාමතාම පැමිණිලිකරු හට තිබූ උසස්වීමේ අවස්ථාව අහිමි කිරීමේ චේතනාවෙන් අවිධිමත් හා අත්තනෝමතික ලෙස අවසන් දිනය දීර්ඝ කරමින් තවත් අපේක්ෂකයින්ට අවස්ථාව ලබා දී තිබෙන බවට පැමිණිලිකරු විසින් ඉදිරිපත් කර ඇති

- 2023 වර්ෂයේදී උක්ත තනතුර සඳහා අයදුම්පත් කැඳවීමේ අවසාන දිනය වනවිට මෙම පැමිණිලිකරු සුදුසුකම් සම්පූර්ණ කිරීමට (SLM -3 තනතුරේ අවුරුද්දක සේවා කාලය) දින 08ක කාලයක් තිබියදී, මෙම පැමිණිලිකරු පිළිබඳ සළකා බලා දින දීර්ඝ කිරීමක් සිදු නොකිරීම.
- 2021 වසරේ දී ජ්‍යෙෂ්ඨ ක්‍රියාකරවන තනතුරට අදාළව පැවති සම්මුඛ පරීක්ෂණයේදී සිදුවූ අසාධාරණය පිළිබඳව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට පැමිණිලි කිරීමේ ප්‍රතිඵලයක් ලෙස අදාළ උසස්වීම ලබා දීම.
- විධායක නිලධාරින්ගේ සංගමය විසින් ඉල්ලීම සිදු කර ඇත්තේ 2024.07.02 දිනැති ලිපිය මගින් සහ 2024.07.15 දිනට ප්‍රථමව දින දීර්ඝ කිරීමට කාලයක් තිබියදී අයදුම්පත් ලැබී අවසන් වීමෙන් පසුව දින දීර්ඝ කිරීම.

යන කරුණු අනුව අනාවරණය වේ.

තවද, ඉහත සඳහන් පරිදි අයදුම්පත් කැඳවීමේ අවසන් දිනය දීර්ඝ කිරීමෙන් පසුව අයදුම් පත්‍ර ඉදිරිපත් කර ඇති අපේක්ෂකයින් උක්ත තනතුර සඳහා වූ සුදුසුකමක් වන SLM -3 ශ්‍රේණියේ අවුරුද්දක සේවා කාලය සම්පූර්ණ කර තිබෙන්නේ 2024.07.31 දින වන අතර ඔවුන් ඊට අදාළව සේවයේ ස්ථිර කර තිබෙන්නේ 2024.08.12 සහ 2024.10.02 යන දිනැති ලිපි මගින් බවට ඉදිරිපත් කර ඇති ලේඛන අනුව නිරීක්ෂණය වේ. එනම්, එම තනතුර සඳහා මුල් අවස්ථාවේදීම සුදුසුකම් ලබා තිබූ අයදුම්කරුවන්ගේ ජ්‍යෙෂ්ඨතාවය නොසළකා කටයුතු කර ඇති බවට නිරීක්ෂණය වේ. අයදුම්පත්‍ර කැඳවන අවස්ථාව වන විට සියලුම සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්ට ප්‍රමුඛතාවය ලබා දීම සාමාන්‍ය කරුණක් වේ.

එසේ තිබුණද, මෙම පැමිණිල්ලේ උද්ගත වී ඇති ගැටළුව සළකා බැලීමේදී ජ්‍යෙෂ්ඨතාවයද නොසළකා හරිමින් වගඋත්තරකාර ආයතනයේ නිලධාරීන් සියළුම දෙනා සාමාජිකත්වය දරා නොමැති සංගමයක ඉල්ලීම පමණක් සළකා බලා විධිමත් අනුමැතියකින් තොරව අත්තනෝමතික ලෙස කටයුතු කරමින් අයදුම්පත් කැඳවීමේ දින දීර්ඝ කර ඇති අතර එසේ දින දීර්ඝ කිරීමෙන් පසු උක්ත තනතුර සඳහා සුදුසුකම් ලැබීමට සම්පූර්ණ කර තිබිය යුතු මූලික සුදුසුකම් වූ SLM 3 ශ්‍රේණියේ වසරක කාලය සම්පූර්ණ කරන ලද නිලධාරීන් ඉලක්ක කරගෙන ඉහත සඳහන් අත්තනෝමතික හා අසාධාරණ ලෙස කටයුතු කර ඇති බවටත් කරුණු පැහැදිලි වේ.

මෙම පැමිණිලිකරු විසින් මෙම ගැටළුව පිළිබඳව ජනාධිපති ලේකම් කාර්යාලය වෙත ද පැමිණිල්ලක් ඉදිරිපත් කර ඇති බවත්, එහිදී අධ්‍යක්ෂ (මහජන සම්බන්ධතා) (ජනාධිපති ලේකම් වෙනුවට) විසින් ලේකම්, ප්‍රවාහන, මහාමාර්ග වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය වෙත 2025.09.09 දිනැති ලිපියක් යොමු කර ඇති අතර, එහි සඳහන් කර ඇත්තේ රජයේ යම් තනතුරක් පිරවීම සඳහා අයදුම්පත් කැඳවීමට ප්‍රසිද්ධ කිරීමෙන් පසුව යම් හේතුවකින් අයදුම්පත් භාරගැනීමේ අවසන් දිනයේ වෙනස්වීමක් සිදු කළ විටක එහි ඉල්ලා ඇති සුදුසුකම් සපුරාලීමේ දිනය වෙනස් නොකිරීම සාමාන්‍ය කාර්යාල ක්‍රමය බවත් උක්ත උසස්වීම ලබාදීමේදී එම ක්‍රමවේදය අනුගමනය කර නොමැති බව නිරීක්ෂණය වන බැවින් මේ සම්බන්ධයෙන් පරීක්ෂණයක් පවත්වා වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස වේ.

ඉහත කී ජනාධිපති ලේකම් කාර්යාලය විසින් නිකුත් කර ඇති ලිපිය අයදුම්පත් බාරගැනීමේ අවසන් දින දීර්ඝ කිරීමක් සිදු කිරීමට හැකි නමුත්, සුදුසුකම් සපුරාලීමේ දිනය වෙනස් කිරීම සාමාන්‍ය කාර්යාල ක්‍රමවේදයට පටහැනි බවට නිරීක්ෂණය කර ඇති බවට පැහැදිලි වේ. ඒ අනුව මෙහිදී වගඋත්තරකාර

ආයතනය විසින් නියෝජ්‍ය ප්‍රධාන ක්‍රියාකරවන කළමණාකරු තනතුර සඳහා මුල් අවස්ථාවේ දී පල කළ දැන්වීමේ සඳහන් අයදුම්පත් භාරගැනීමේ අවසන් දිනය, විධිමත් ලෙස අනුමැතියක් ලබා නොගෙන අත්තනෝමතික ලෙස 2024.08.15 දින දක්වා දීර්ඝ කිරීම සහ එසේ දීර්ඝ කළ දිනය දක්වා සුදුසුකම් සම්පූර්ණ කිරීමට අවස්ථාව ලබා දීම යන ක්‍රියාවලියත් පිළිගත නොහැකි අතර ඒ තුළින් පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝණය වී ඇති බවට කරුණු අනාවරණය වේ.

ඉහත වගඋත්තරකාර අධිකාරියේ උසස්වීම් ලබාදීමේ ක්‍රියාපටිපාටිය තුළ සිදුවී ඇති අක්‍රමිකතා සම්බන්ධව ජනාධිපති ලේකම් කාර්යාලයට දැනුම් දීම මත අදාළ අමාත්‍යාංශයේම ප්‍රධාන අභ්‍යන්තර විගණක විසින් 2026.01.09 දිනැතිව අංක MPCA/IA/IN/07-17/2025 මගින් ලේකම්, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය වෙත යවා ඇති වාර්තාවේ පහත සඳහන් කරුණු නිරීක්ෂණය කර ඇත.

- මානව සම්පත් කළමණාකාරීත්වය විසින් අභ්‍යන්තර අයදුම්පත් කැඳවීමක් සිදු කිරීමට පෙර එම අවස්ථාවේදී ආයතනය තුළ පවතින පුරප්පාඩු සංඛ්‍යාව සහ ඒ වනවිට සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් සංඛ්‍යාව පිළිබඳව මනා අවබෝධයකින් යුතුව කටයුතු කළයුතු වුවත් එලෙස විශ්ලේශනයක් සිදු කර නිසි මානව සම්පත් සැලසුමකින් යුතුව කටයුතු කර නොමැති බව.
- 2024.06.26 අයදුම්පත් කැඳවීම සිදු කර නැවත මාණ්ඩලික නිලධාරීන්ගේ සංගමයේ ඉල්ලීම මත 2024.08.15 දක්වා දින දීර්ඝ කිරීමක් සිදු කිරීම මගින් තවත් අයදුම්කරුවන් හට අවස්ථාව හිමිවීම තුළ නියමිත දිනයට සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්ට අසාධාරණයක් සිදුවී ඇති බව.
- මෙම තනතුර සඳහා තේරී පත්වී ඇත්තේ ද දෙවන වර අයදුම්පත් කැඳවූ අවස්ථාවේ එනම් 2025.08.15 දිනට සුදුසුකම් සම්පූර්ණ වූ නිලධාරීන් දෙදෙනෙකු බව.
- සම්මුඛ පරීක්ෂණයෙන් ලකුණු හිමිකර ගත් පිළිවෙළ අනුව ෆාහිම් මහතා 4 වන ස්ථානයට පත්වී සිටියද සේවා පළපුරුද්ද සැළකිල්ලට ගැනීමේදී ඒ මහතා හට SLM 3 වැටුප් කාණ්ඩයේ තනතුරෙහි වසර 2 කට අධික සේවා පළපුරුද්දක් ඇති බව සහ 01, 02 සහ 03 ස්ථාන ලබා ගත් නිලධාරීන් තිදෙනා හට ඇත්තේ වසරක සේවා පළපුරුද්දක් පමණක් බවටත්,
- අයදුම්පත් කැඳවීමේ දින දීර්ඝ කිරීම මගින් තවත් නිලධාරීන් පිරිසකට අයදුම් කිරීමට අවස්ථාව හිමිවීම සහ එම නිලධාරීන් අතුරින් තිදෙනෙකුට ප්‍රමුඛතාවය ලබාදීම තුළ ෆාහිම් මහතාට සෘජු ලෙසම අසාධාරණයක් සිදුවී ඇති බව.
- ජ්‍යෙෂ්ඨත්වය අනුව සළකා බලා ෆාහිම් මහතා වෙත නියෝජ්‍ය ප්‍රධාන ක්‍රියාකරවන කළමණාකරුගේ රාජකාරි පැවරීම සිදු කර තිබුණද සම්මුඛ පරීක්ෂණයේදී ඒ පිළිබඳව සැළකිල්ලට ගැනීමක් සිදු කර නොමැති බවත් මාස 9 කට අධික කාලයක් එකී තනතුරේ රාජකාරි ආවරණය ද සිදු කර තිබියදී සේවා පළපුරුද්ද අඩු නිලධාරීන් එම තනතුරට තෝරා පත් කර ගැනීම තුළ ෆාහිම් මහතා හට අසාධාරණයක් සිදුවී ඇති බව.
- නියෝජ්‍ය ප්‍රධාන ක්‍රියාකරවන කළමණාකරු තනතුර සඳහා 2023.05.02 අයදුම්පත් කැඳවූ අවස්ථාවේ එම්.එච්.එම්.ෆාහිම් මහතා විසින් සිදු කළ ඉල්ලීම සළකා බැලීමක් සිදු නොකර 2024.06.26 අයදුම්පත් කැඳවූ අවස්ථාවේ මාණ්ඩලික නිලධාරීන්ගේ සංගමයේ ඉල්ලීම මත දින දීර්ඝ කිරීමක් සිදු කිරීම තුළද ආයතනයේ පරිපාලනයේ අපක්ෂපාතී ලෙස කටයුතු කර නොමැති බව.
- යම් හේතුවක් මත අයදුම්පත් බාර ගැනීමේ අවසන් දිනයේ වෙනස් කිරීමක් සිදු කරන්නේ නම් ඒ සඳහා ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ ඉහළ කළමණාකාරීත්වයේ අනුමැතිය ලබා එය විධිමත් ක්‍රමවේදයක් අනුව සිදු කළයුතු අතර මෙම අවස්ථාවේදී මානව සම්පත් කළමණාකාරීත්වය විසින් එවැනි විධිමත් ක්‍රියාමාර්ගයක් අනුගමනය කර නොමැති බව.

තවද, ඉහත වගඋත්තරකාර පාර්ශවය විසින් නියෝජ්‍ය ප්‍රධාන ක්‍රියාකරවන කලමනාකරු තනතුර සඳහා 2025.02.24 දින පවත්වන ලද සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබාදී ඇති නිර්නායකයන් පිළිබඳව මෙම

කොමිෂන් සභාවේ අවධානය යොමු කරන ලදී. එහිදී ලකුණු ලබාදීමේ ලේඛනයේ මූලික සුදුසුකම් ලැබීම වෙනුවෙන් ලකුණු 25 ක් වෙන් කර ඇති බවට නිරීක්ෂණය වේ. සාමාන්‍යයෙන් තනතුරක් සඳහා බඳවා ගැනීමේදී හෝ උසස් කිරීමේදී සුදුසුකම් ලැබීමට අදාළ බඳවා ගැනීමක හෝ උසස් වීම සඳහා අනුමත ක්‍රියාපටිපාටියේ සඳහන් මූලික සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු ය. එම මූලික සුදුසුකම් සියල්ල සම්පූර්ණ කර තිබේ නම් පමණක් අපේක්ෂකයෙකුට අදාළ තනතුර සඳහා වූ ලිඛිත විභාගය හෝ සම්මුඛ පරීක්ෂණයන් සඳහා අවස්ථාව හිමිවනු ඇත. මෙහිදී මූලික සුදුසුකම තිබීම පමණක් අදාළ තනතුර සඳහා තේරී පත්වීමට අවස්ථාවක් ලබා නොදෙන අතර එම මූලික සුදුසුකම් සම්පූර්ණ කිරීමෙන් පසුව පවත්වන ලිඛිත විභාගයෙන් ද සම්මුඛ පරීක්ෂණයේදී ද ලකුණු ලබා ගතයුතු බවට පැහැදිලි වේ. කරුණු එසේ තිබියදී මූලික සුදුසුකම් සියල්ල සම්පූර්ණ කරමින් අදාළ තනතුර සඳහා පවත්වන ලද සම්මුඛ පරීක්ෂණය සඳහා පෙනී සිටින අවස්ථාවේ නැවත වරක් මූලික සුදුසුකම් සම්පූර්ණ කිරීම වෙනුවෙන් ලකුණු වෙන් කිරීම විධිමත් නොවන සම්මුඛ පරීක්ෂණ ක්‍රියාවලියක් බවට මෙම කොමිෂන් සභාව විසින් නිරීක්ෂණය කර සිටී.

තවද උක්ත තනතුර සඳහා මූලික සුදුසුකම් ලෙස ඉල්ලා ඇත්තේ

*II (a)* ***Educational & Professional Qualification:***

*Should possess a post Graduate Degree/ Post Graduate Diploma from a recognized University in Business Administration/Marketing/Management/Port Management/Commerce/Economics/Logistics & Transport or Statistics.*

*With .........* යන සුදුසුකම් වේ.

මෙහිදී *post Graduate Degree/ Post Graduate Diploma* ලෙස සඳහන් කිරීම තුලින් පශ්චාත් උපාධිය හා පශ්චාත් උපාධි ඩිප්ලෝමාව යන සුදුසුකම් සමාන සුදුසුකම් ලෙස සළකා උක්ත තනතුරට අදාළ මූලික සුදුසුකම් ලෙස දක්වා තිබීම ද අවිධිමත් පටිපාටියක් බවට මෙම කොමිෂන් සභාව විසින් නිරීක්ෂණය කර සිටී.

තවද, Performance Evaluation සඳහා ලකුණු ලබාදී ඇත්තේ සම්මුඛ පරීක්ෂණය පැවැත්වූ දිනට පෙර කාර්තු දෙකක කාර්ය සාධනය සළකා බලා ඒ අනුව උපරිම ලකුණු විස්සක් දක්වා ලකුණු ලබා දී ඇති බවට වගඋත්තරකාර පාර්ශවය විසින් ඉදිරිපත් කර ඇති කරුණු පිළිබඳව අවධානය යොමු කරන ලදී. එහිදී සම්මුඛ පරීක්ෂණයට සහභාගි වූ අයදුම්කරුවන් හය දෙනාගේ එම සම්මුඛ පරීක්ෂණ දිනට පෙර මාස 6 ක කාලයකදී ඔවුන්ගේ කාර්ය සාධනය සළකා බලා සියළුම දෙනාට ලකුණු 15 ලබා දී ඇති බවට ඉදිරිපත් කර ඇති ලකුණු ලැයිස්තුව අනුව නිරීක්ෂණය වේ.

එසේ වුවද වගඋත්තරකරු විසින් ඇමුණුම් 2 ලෙස ඉදිරිපත් කර ඇති ශ්‍රී ලංකා වරාය අධිකාරී චක්‍රලේඛ අංක 15/2010 " Marking Scheme For Interviews of Executive Category" යන ශීර්ෂය යටතේ නිකුත් කර ඇති චක්‍රලේඛයක් වන අතර, එම චක්‍රලේඛය එවකට සිටි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2011.02.18 දින අනුමත කරගෙන තිබෙන බවට නිරීක්ෂණය වේ. එහිදී Performance Evaluation යන නිර්නායකය සඳහා පසුගිය වසර 03 ක් සඳහා සම්පූර්ණ කරන ලද කාර්ය සාධන ඇගයීම ලකුණු වෙන් කිරීම සඳහා පදනම වන බවට සඳහන් කර ඇති නමුත් වගඋත්තරකාර පාර්ශවය විසින් කාර්තු දෙකකට අදාළ කාර්ය සාධන ඇගයීම් සළකා බලා ලකුණු ලබා දීම ආයතනයේ එවකට සිටි අධ්‍යක්ෂ මණ්ඩලය විසින්ම අනුමත කරගෙන ඇති ලකුණු දීමේ පටිපාටියට පටහැනිව කටයුතු කර ඇති බවට නිරීක්ෂණය කෙරේ.

තවද, ඉහත සම්මුඛ පරීක්ෂණයේදී Performance at the interview සඳහා ලකුණු 10 ක් වෙන් කර ඇති අතර ඒ සඳහා ලකුණු ලබා දී ඇත්තේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ නියෝජිතයින් විසින් අසනු ලබන ප්‍රශ්න සඳහා ලබා දෙන පිළිතුරු, සම්මුඛ පරීක්ෂණයට අයදුම්කරුවන් මුහුණ දෙන ආකාරය, ඔවුන්ගේ ආකල්ප සහ නායකත්ව ලක්ෂණ පිළිඹිබු කිරීම යනාදිය සළකා බලා එම ලකුණු ලබා දී ඇති බවට

වගඋත්තරකාර පාර්ශවය විසින් කරුණු ඉදිරිපත් කර ඇත. ඉහත කී 15/2010 යන චක්‍රලේඛය ප්‍රකාරව සම්මුඛ පරීක්ෂණයේදී අදාළ ක්ෂේත්‍ර සම්බන්ධව ප්‍රශ්න 5 ක් අයදුම්කරුවන් වෙත ඉදිරිපත් කළයුතු බවත් ඒ සඳහා ඔවුන් වාචිකව උත්තර ලබා දීම සහ සම්මුඛ පරීක්ෂණයට අයදුම්කරුවන් මුහුණ දෙන ආකාරය, ඔවුන්ගේ ආකල්ප සහ නායකත්ව ලක්ෂණ අනුව ලකුණු ලබා දිය යුතු බවත් සඳහන් කර ඇත. එසේ වුවද, ඉදිරිපත් කර ඇති ලකුණු ලැයිස්තුව සළකා බැලීමේදී සම්මුඛ පරීක්ෂණයේදී සියලුම අයදුම්කරුවන්ගෙන් ප්‍රශ්න 5 ක් අසා තිබේද නැද්ද යන්නත් එසේ ප්‍රශ්න කර තිබේ නම් ඒ සඳහා එක් එක් අයදුම්කරුවන් උත්තර ලබා දී තිබේද නැද්ද යනුවෙන් තහවුරු කිරීමට හැකියාවක් නොපවතී. ඒ අනුව අයදුම්කරුවන් අතරේ සාධාරණයක් වන පරිදි සම්මුඛ පරීක්ෂණය සිදුවී ඇත්ද යන්න ගැටළු සහගත වේ.

තවද, සම්මුඛ පරීක්ෂණයේදී එහි සිටින සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ සාමාජිකයින් විසින් මුල් අවස්ථාවේ දී එක් එක් අයදුම්කරුවන් වෙත වෙන් වෙන්ව ලකුණු ලබාදීමක් සිදුවන අතර, අවසානයේදී එම ලකුණු සියල්ල එකතු කර අවසාන ලකුණු ලැයිස්තුවක් සෑදීම සාමාන්‍ය ක්‍රමවේදය වේ. එසේ වුවද, වගඋත්තරකාර පාර්ශවය විසින් එවැනි ආකාරයට ලකුණු ලබා දෙන ලද ලකුණු ලැයිස්තු ඉදිරිපත් කරන ලෙසට ඉල්ලා සිටියද, එය ඉදිරිපත් කර නොමැති අතර අවසාන ලකුණු ලැයිස්තුවක් පමණක් ඉදිරිපත් කිරීම තුළින් පැහැදිලි වන්නේ එක් එක් අයකුම්කරුවන් වෙත වෙන් වෙන්ව ලකුණු දීමක් සිදු කිරීමෙන් තොරව සියලුම සම්මුඛ පරීක්ෂණ මණ්ඩල සාමාජිකයින් විසින් එකවර ලකුණු දීමක් සිදුවී ඇති බවයි. මෙවැනි අවස්ථා වලදී සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ සාමාජිකයින් අතරින් ඉහළම තනතුර දරණ සාමාජිකයෙකුට අවශ්‍ය පරිදි සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය මෙහෙයවා ගැනීමටත්, ඒ අනුව ඔහුගේ අභිමතයට ගැලපෙන තැනැත්තෙකු තෝරා ගැනීමට අවශ්‍ය ලකුණුදීමක් සිදු කිරීමට හැකියාව පවතින බවද මෙම කොමිෂන් සභාව නිරීක්ෂණය කර සිටී.

තවද, වගඋත්තරකාර පාර්ශවය විසින් 2025.02.24 දින පවත්වන ලද ඉහත කී සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබාදී ඇත්තේ, ඉහත සඳහන් පරිදි 2011 වර්ෂයේ එවකට සිටි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඇති, එනම් අවුරුදු 14 කට ආසන්න කාලයක් පැරණි පටිපාටියක් අනුව බවටද නිරීක්ෂණය වේ. ඒ අනුව ඉතා පැරණි ලකුණු ලබාදීමේ ක්‍රමවේදයක් අනුව 2025 වර්ෂයේ පවත්වා ඇති උක්ත තනතුර සඳහා ඉහත සඳහන් කළ පරිදි යම් යම් අවස්ථා වලදී විධිමත් නොවන නිර්නායකයන් සඳහා ලකුණු ලබාදීම පිළිගත හැකි ක්‍රමවේදයක් නොවන බවට මෙම කොමිෂන් සභාව විසින් නිරීක්ෂණය කර සිටී.

වගඋත්තරකාර ආයතනය විසින් 2025.02.24 දින පවත්වන ලද ඉහත කී සම්මුඛ පරීක්ෂණයෙන් අනතුරුව උක්ත ගැටළුසහගත තනතුර සඳහා මේ වනවිට පත්වීම් ලැබී ඇති නිලධාරීන් වන පිළිවෙලින් සම්මුඛ පරීක්ෂණයේදී ලබාදී ඇති ලකුණු අනුව පළමු සහ දෙවන ස්ථානය ලබා ගන්නා ලද ජේ.ආර්.එම්. සූරියබණ්ඩාර සහ ඩබ්.එච්.ඒ. පුෂ්පකුමාර යන අයගෙන් මෙම පැමිණිල්ල සම්බන්ධව විමසීමක් සිදු නොකර ඇති අතර එම සම්මුඛ පරීක්ෂණයේදී ලබාදී ඇති ලකුණු අනුව තෙවන ස්ථානය ලබා ගන්නා ලද පී.ඩී.එච්. පීරිස් මහතා විසින් ස්ව කැමැත්තෙන් ලිඛිත වාර්තාවක් ඉදිරිපත් කරමින් දන්වා ඇත්තේ උක්ත තනතුර සඳහා වගඋත්තරකාර පාර්ශවය විසින් පවත්වන ලද සම්මුඛ පරීක්ෂණය අනුමත ලකුණු දීමේ පටිපාටිය අනුව නිසි පරිදි විනිවිදභාවයකින් පැවැත්වූ බවත් ඉහත පැමිණිලිකරු විසින් එකී සම්මුඛ පරීක්ෂණයේදී තේරී පත්වූ නිලධාරීන් වෙත පත්වීම් ලබාදීම වැලැක්වීමේ චේතනාවෙන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත මෙම පැමිණිල්ල ගොනු කර ඇති බවත් මෙම කොමිෂන් සභාව විසින් නිකුත් කර ඇති අතුරු නිර්දේශය පිළිබඳව ඔහු සෑහීමට පත් නොවන බවත් ය. මෙම පැමිණිල්ල සම්බන්ධව පැමිණිලිකරු විසින් සහ වගඋත්තරකාර පාර්ශවය විසින් ඉදිරිපත් කර ඇති ලිඛිත සැල කිරීම් සහ ලේඛන අනුව මෙම කොමිෂන් සභාව විසින් අනාවරණය කර ගන්නා ලද කරුණු පදනම්ව ඉහත සඳහන් පී.ඩී.එච්. පීරිස් යන අය විසින් ඉදිරිපත් කර ඇති කරුණු මෙම කොමිෂන් සභාව ප්‍රතික්ෂේප කර සිටී.
එසේම කාලය දීර්ඝ කිරීම අත්තනෝමතික හා නීතියට පටහැනි බවට කොමිෂන් සභාව තීරණය කර ඇති අතර පී.ඩී.එස්. පීරිස් මයා ද එකී කාලය දිගු කිරීම මත සම්මුඛ පරීක්ෂණයට සුදුසුකම් ලැබූවකු බව කොමිෂන් සභාව අවධානයට ගනී. දැනට මෙකී තනතුරට පත්වීම් ලබාදී ඇති දෙදෙනාද එම කුලකයට අයත්වන අතර, මේ අවස්ථාවේ සියලුම ප්‍රායෝගික කරුණු සළකා ඔවුන් සම්බන්ධ නිගමනයක් ලබාදීමට කොමිෂන් සභාව අදහස් නො කරයි.

නිගමනය

ඉහත නිරීක්ෂණයන් අනුව පැමිණිලිකරු විසින් මෙම කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති පැමිණිල්ලේ සඳහන් ආකාරයට 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 111 වන පරිච්ඡේදයේ 12(1) ව්‍යවස්ථාව මගින් තහවුරු කර ඇති පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝණය වී ඇති බවට මෙම කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබේ.

ඒ අනුව පහත සඳහන් පරිදි නිර්දේශ කර සිටී

01 පැමිණිලිකරු වෙත නියෝජ්‍ය ප්‍රධාන ක්‍රියාකරවන කළමණාකරු තනතුර කඩිනමින් ලබා දිය යුතු ය.

02 අත්තනෝමතික ලෙස කටයුතු කර ඇති බව අනාවරණය වන ප්‍රධාන කළමණාකරු (මානව සම්පත් හා පරිපාලන) සම්බන්ධව සහ එකී සම්මුඛ පරීක්ෂණ ක්‍රියාවලියේදී ක්‍රියාකර ඇති ආකාරය පිළිබඳ පරීක්ෂා කර ඒ සම්බන්ධ වාර්තාවක් මෙම කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීමට අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් කටයුතු කළ යුතු ය.

2026. [illegible] . 04 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 (7) වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරු වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක කර ඉදිරිපත් කිරීමට නියමිත දින සිට සතියක කාලයක් තුළ මෙම නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින් ද කොමිෂන් සභාවට දැනුම් දියයුතු වන අතර එදිනට පෙර අදාළ දැනුම් දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම සම්බන්ධයෙන් සළකා නො බලන බව ද වැඩිදුරටත් දන්වමු.

එල්.ටී.බී. දෙහිදෙණිය,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

විනිසුරු එල්.ටී.බී.දෙහිදෙණිය
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී. පුංචිහේවා,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

නිමල් ජී. පුංචිහේවා
ජ්‍යෙෂ්ඨ නීතිඥ
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

පිටපත : 01 ගරු අනුර කරුණාතිලක මහතා,
අමාත්‍යතුමා,
වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය,
සෙත්සිරිපාය, බත්තරමුල්ල.

02 ඩබ්.ඩබ්.එස්. මංගල මහතා,
ලේකම්,
වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය,
සෙත්සිරිපාය, බත්තරමුල්ල.

03 විගණකාධිපති,
ජාතික විගණන කාර්යාලය,
306/72, පොල්දුව පාර, බත්තරමුල්ල.